www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2004 මැතිවරනයෙන් ඉක්බිති සමාජවාදී සමානතා පක්ෂයේ ඉදිරිදර්ශන හා කර්තව්‍යයෝ

## After the 2004 election: perspectives and tasks of the Socialist Equality party

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2004 නොවැම්බර් 15**

*යට දැක්වෙන්නේ 2004 නොවැම්බර් 14 වැනි දින මිචිගන් ප්‍රාන්තයේ ඈන් ආබර්හි දී ඩෙට්රොයිට් නාගරිකයේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජිකත්වය හමුවේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සභාපති හා සසපයේ ජාතික ලේකම් ඩේවිඩ් නෝර්ත් විසින් ඉදිරිපත් කල වාර්තාව යි.*

01. දෙවැනි බුෂ් පරිපාලනයේ පලමු වසරට අප පිවිසෙමින් සිටිය දී 2004 මැතිවරනයේ ප්‍රතිඵල විශ්ලේෂනය කිරීම ද සමාජවාදී සමානතා පක්ෂයේ කටයුතු සඳහා මග පෙන්වන්නා වූ ඉදිරි දර්ශනය සකසා ගැනීම ද අද පැවැත්වෙන මෙම රැස්වීමෙහි අරමුන වන්නේ ය. මැතිවරනයේ ප්‍රතිඵල එක්සත් ජනපදයේ මෙන් ම ජාත්‍යන්තර දේශපාලනය කෙරෙහි ද ප්‍රගාඪ බලපෑම් ඇති කර තිබෙන බව දැනට මත් පැහැදිලිව තිබේ. ජෝර්ජ් බුෂ් යලි තේරී පත්වීම ජනගහනයේ පුලුල් කොටස්වලට කම්පනයක් වී ඇත. නරක, කැත හා අනතුරුදායක යමක් සිදු වී ඇතැයි යන හැඟීමක් එක්සත් ජනපදය තුල මෙන්ම ලෝකය වටා ද දක්නට ඇත.

02. 2000 මැතිවරන ප්‍රතිඵලය අහම්බයක් නොමග යෑමක්, බව ද කිසියම් ස්වභාවික විරේකකරන ක්‍රියාවලියක් මගින් එය 2004 එය විසින් ම නිවැරදි කර ගනු ඇතැයි ද යන පුලුල්ව පැතිරුනු විශ්වාසයක් මැතිවරන දිනයට පූර්වයෙන් පැවතුනි. බුෂ්ගේ යලි තේරී පත්වීම සිදු විය නො හැකි දෙයක් බවට පැවති විශ්වාසය, 2000 දී සොරකම් කල මැතිවරනයෙන් පසු, ගෙවී ගිය සිව් වසර තුල සිදු වූ සියල්ලෙන් ම තවදුරටත් තහවුරු කෙරිනි. යුද්ධය වෙනුවෙන් බුෂ්ගේ විවිධ යුක්තිකරනයන් මුසාවන් ම බව හෙලිදරව් වීම, ආක්‍රමනයේ ව්‍යසනකාරී විපාකයන්, විරැකියාව වැඩීයාම, ජීවන තත්වයන් වේගයෙන් පහල වැටීම, මත විමසුම්වල ප්‍රකාශ වූ පරිදි එක්සත් ජනපදය වැරදි දිසාවකට ගමන් කරන බවට පැවති පුලුල් හැඟීම, යන මේ සියල්ලෙහි ද, ඒ හා බැඳී තිබුනු වාතාවරනයන්හි ද ප්‍රතිඵලය වසයෙන් මැතිවරන දිනයේ දී බුෂ් පරිපාලනය ජාතික ඡන්දදායකය විසින් ප්‍රතික්ෂේප කරනු ඇතැයි යන්න විශ්වාස කිරීමට බොහෝ දෙනෙකුට අවශ්‍යව තිබුනේ ය. බුෂ්ගේ මානසික සීමාසහිත භාවයන් කෙරෙහි තියුනු හා ක්ෂමා විරහිත එලියක් විහිද වූ ජනාධිපති විවාද ත්‍රිත්වයේ බලපෑම හමුවේ මෙම ශුභවාදී පූර්ව හැඟීම වැඩිදියුනු විය.

03. ප්‍රාර්ථනා මත පදනම් වූ චින්තාවන්ගේ හා ආත්ම වංචනයේ සුවිසල් මාත්‍රාවන්ගෙන් පෝෂනය වූ මෙම පූර්ව-මැතිවරන අපේක්ෂාවන් 2004 නොවැම්බර් 02 වන දා බිඳී විසිරුනි. 1974 තරම් ඈතක වෝටගේට් සෝලියේ උච්ඡාවස්ථාවෙහි දී, රිචඩ් නික්සන්ගේ ඉල්ලා අස්වීමෙන් පසුව, අවසානයේ දී “හොඳ හාදයන් ජයගත්තේ කෙසේ ද?” [How the Good Guys Finally Won?] යන මැයෙන් නිව්යෝක් තීරු රචක ජිම් බ්‍රෙස්ලින් පොතක් ලිවීය. රිපබ්ලිකන් ජනාධිපතිවරයාගේ නීති විරෝධී හා ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවන් මගින් ඇවිලුනු අර්බුදයකින් පසුව, ඒ කෙරෙහි ඇමරිකානු ලිබරලුන් දැක්වූ මන්දෝත්සාහය, මෙම මාතෘකාවෙන් ම පිලිබිඹු කෙරින. අපරාධකරුවා ඉල්ලා අස් වූ අතර පද්ධතිය අර්බුදයෙන් ගොඩ ආ බවක් පෙනෙන්නට තිබුනි. ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයට ජයවේවා. එහෙත් වසර තිහකට පසුව මෙවර “හොඳ හාදයන්” — ඩිමොක්‍රැටික් පක්ෂයේ කමකට නැති නිවටයන් හා බියගුල්ලන්ට තරමක් නොගැලපෙන්නා වූ හැඳින්වීමක් — ජයගත්තේ නැත. ඒ වෙනුවට ඉනවටක් ලෙයෙහි හා දූෂනයෙහි එරී සිටින දේශපාලන අපරාධකරුවන්ගෙන් සැදුම්ලත් පරිපාලනයක් යලි බලයට පත් විය. ඇත්තවසයෙන් ම ලෙහෙසි පිලිතුරක් සොයාගත නො හැකි ප්‍රශ්නයක් වන මෙය පැහැදිලි කල හැක්කේ කෙසේ ද? එහෙත් ජෝර්ජ් බුෂ්ගේ යලි තේරී පත්වීම ගෙනහැර දක්වා ඇත්තේ ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදය මෙන්ම සමස්ත ඇමරිකානු සමාජය ද, සරල නො වූ ද, සම්ප්‍රදායික විසඳුම් නො පවත්නා වූ ද, ගැඹුරුතම අර්බුදයකට මුහුන දී ඇති බව යයි යමෙක් ආරම්භයක් වසයෙන් පිලිගත යුතුව ඇත.

04. ඩිමොක්‍රැටික් පක්ෂ නායකත්වයට නම් ඔවුන්ගේ පරාජයට හේතුව ඔවුන්ගේ අපේක්ෂකයා ද, මැතිවරන ව්‍යාපාරය ද, ප්‍රධාන ඇමරිකානු දේශපාලන ප්‍රවාහය තුල ඕනෑවට වඩා වමට නැඹුරු වීම බව ප්‍රත්‍යක්ෂ ය.

ඩිමොක්‍රැටිකයෝ, සංගත මාධ්‍යයන්ගේ පූච්චානම්වලට අනුගත වෙමින්, ඇමරිකානු ඡන්දදායකයා එතරම් ලැදියාවකින් වැලඳ ගෙන සිටි "සදාචාරාත්මක ප්‍රශ්න" පිලිබඳව තමා දැක් වූ අඩු සංවේදීතාව තුල තම විනාශයේ මූලයන් සොයා ගනිති. "ඔවුනගේ ඡන්දවලින් කොටසක් බෙදා හදා ගැනීම පසෙක තැබුව ද අප ඔවුන්ගේ වටිනාකම් බෙදා හදා නො ගන්නේ යයි ඔවුන් සිතන්නේ නම්, දෝලනය වන ඡන්ද දායකයන් බොහොමයක් ප්‍රශ්නවල දී අපට ඇහුම්කන් නො දෙන බව අපට අවබෝධ විය යුතු ය", යි සෙනේට් සභික ජෝසෆ් ලිබර්මාන්ගේ හිටපු උපදේශකයෙකු වූ ඩෑන් ගර්ස්ටේන් *වෝල් ස්ට්‍රීට් ජර්නලයේ* නොවැම්බර් 11 දින පල වූ විස්තර සටහනක සඳහන් කලේ ය.

05. රිපබ්ලිකන් පක්ෂය විසින් මෙතරම් දක්ෂ ලෙස උපයෝගී කර ගෙන ඇති ඊනියා "වටිනාකම්" යනු කවරේද? මැකාතිවාදී උනෙන් පෙලුනු 1950 ගනන් ගෙවී යද්දී හා ප්‍රතිකොමියුනිස්ට්වාදය මැතිවරනය ජය ගැනීමේ මූලෝපායක් ලෙස ශක්‍යතාවයෙන් හීන වෙද්දී, විශේෂයෙන් ම දකුනු දිග ඇමරිකාවේ අප්‍රිකානු ඇමරිකානුන්ගේ මහජන සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයට එරෙහි වූ දේශපාලන ප්‍රතිගාමිත්වය ගසැකෑම මගින් දක්ෂිනාංශික ආර්ථික හා සමාජ ප්‍රතිපත්තීන් සඳහා ජනතා පදනමක් ගොඩනැගීමෙහි ලා රිපබ්ලිකන් පක්ෂය උනන්දු විය. 1964 ගෝල්ඩ් වෝටර් ව්‍යාපාරය දක්වාම දිවයන දකුන රිපබ්ලිකානුවාදයේ මුරකාවලක් බවට පත් වූ අවධියේ දී, සිවිල් අයිතිවාසිකම් නීතියේ අදාල ඡේදයට රිපබ්ලිකන් අපේක්ෂකයා දැඩි විරෝධය පල කලේ ය. පස්සට තල්ලු වී ගිය සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයේ විරුද්ධවාදීන් වෙත ඇමතීම මගින්, දකුනේ නව දේශපාලන පදනමක් ගොඩනංවා ගැනීමේ හැකියාව හඳුනාගත් ඊලඟ රිපබ්ලිකන් ජනාධිපති අපේක්ෂක රිචඩ් නික්සන් විසින් 1968 දී ප්‍රකාශයට පත් කල ඊනියා "දක්ෂින මූලෝපාය" සඳහා, ගෝල්ඩ් වෝටර් පරාජයට පත් වූ නමුත්, ඔහුගේ ව්‍යාපාරය විසින් වේදිකාව සකස් කෙරින.

06. "වටිනාකම් ප්‍රශ්නය" පිලිබඳ ව තවත් තීරනාත්මක මූලාවයවයක් ලෙස ඩිමොක්‍රැටිකයන් අවධාරනය කරන්නේ ආගම් ප්‍රශ්නය යි. මෙහිදී ද ඔවුන් පාපොච්චාරනය කරන්නේ දේව භීතිකාවෙන් පෙලෙන ඇමරිකානුන්ගේ විශ්වාසය තමන් වෙත යලි දිනා ගත යුතු බව යි. "කෙරී මහතා අවසන් දින කිහිපය වන තෙක් ම ආගම ගැන කතා නො කල තරම් ය. ඉන් ඇති වූ හිඩැස තුල කතාකරමින් බුෂ් මහතා දෙවියන් සිටින්නේ තමා පස යයි ඡන්ද දායකයන් වැඩි සංඛ්‍යාවකට ඒත්තු ගැන්වීමට අවස්ථාව ලබාගත් බව ද, කතෝලික අපේක්ෂකයා කතෝලික ඡන්ද අහිමි කරගත්තේ මන්ද යන්න පැහැදිලි කිරීමට මෙය උදව් වන බව ද" ගර්ස්ටේන් ලියයි. මෙය සත්‍යයක් වුවත් (එහෙත් එය එසේ නොවේ.) ඩිමොක්‍රැටිකයන්ගේ බලාපොරොත්තු සුන් වූයේ ආගමික විශ්වාසයන් මත සැලකිය යුතු අවධානයක් යොමු නො කිරීමේ ප්‍රතිඵලය වසයෙන් නම් ආගම එහි අන්තයට ම පසුගාමී හා මූලධර්මවාදී රූපාකාරයෙන් එක්සත් ජනපද දේශපාලනයේ දී අධිකාරවත් සාධකය වූයේ ඇයි ද යන්න තවමත් පැහැදිලි කල යුතු ව ඇත. විශේෂයෙන් ම ඩිමොක්‍රැටික් පක්ෂය සිය ජනාධිපති අපේක්ෂකයා ලෙස ජෝන් එෆ්. කෙනඩි පත් කර ගත් 1960 මැතිවරනයෙහි පටන් වාතාවරනය කෙතරම් ප්‍රගාඪ ලෙස වෙනස් වී ඇත්දැයි සැලකිල්ලට ගන්නා අයෙකුට මෙය බෙහෙවින් බැරෑරුම් ප්‍රශ්නයකි. ජනාධිපති අපේක්ෂකත්වය හිමිකර ගත් දෙවැනි කතෝලිකයා වූයේ ඔහු ය. වසර තිස් දෙකකට පෙර ප්‍රථම කතෝලික අපේක්ෂකයා වූ නිව් යෝර්ක් හි ආන්ඩුකාර ඇල්ෆ්‍රඩ් ඊ. ස්මිත් මැතිවරන ව්‍යාපාරය රුදුරු ආගමික වියරුවකින් දෙදරා යෑමෙන් පසුව ව්‍යසනකාරී පරාජයකට මුහුන පෑවේ ය. ඉතිහාසයේ මෙම දී ඇති තත්වය තුල 1960 සැප්තැම්බර් 12 දින ටෙක්සාස්හි හූස්ටන්වල දී දකුනේ බැප්ටිස්ට් ආගමික නායකයන් සිය ගනනක් ඉදිරියේ දී ආගම් ප්‍රශ්නය ගැන එක එල්ලේ ම කථා කිරීමට කෙනඩිට බල කෙරුනි.

07. "බටහිර වර්ජිනියාවේදී මා දුටු කුසගින්නෙන් පෙලෙන දරුවන්, තම වෛද්‍ය ගාස්තු ගෙවා ගත නො හැකි වියපත් වූවන්, තම ගොවිපල අත් හැර යාමට බල කෙරුනු පවුල් - පාසල් අතලොස්සක් හා මුඩුක්කු කන්දරාවක් සහිතව චන්ද්‍රයා සහ අභ්‍යවකාශය තරනය කිරීමට බොහෝ ප්‍රමාද වී යැයි තැවෙන ඇමරිකාවක් - වැනි ඇමරිකාව මුහුන දී සිටින දහසකුත් තීරනාත්මක ප්‍රශ්න තිබිය දී, 1960 හි ඇමරිකාව තුල, ආගම් ප්‍රශ්නය සාකච්ඡා කිරීමට සිදුවීම පවා සිය කනස්සල්ලට හේතු වන බව පෙන්වා දෙමින් කෙනඩි කතා කලේ ය. මෙම ව්‍යාපාරය තීරනය කල යුතු සැබෑ ප්‍රශ්න නම් මේවා ය" යි ඔහු ප්‍රකාශ කලේ ය. "යුද්ධය, කුසගින්න, නූගත්කම හා අපේක්ෂා භංගවීම යන මේවා ආගමික ප්‍රශ්න නොවන අතර ආගමික බාධක ද නො හඳුනයි." ඔහුගේ කතෝලික පසුබිම නිසා ව්‍යාපාරය තුල ආගම මාතෘකාවක් බවට පත්ව තිබෙන බව පිලිගත් කෙනඩි "යලි වතාවක් මවිසින් සඳහන් කිරීම අත්‍යවශ්‍ය යැයි පැහැදිලිව පෙනී යන දෙය නම්, ප්‍රශ්නය වන්නේ මා විශ්වාස කරන ඇමරිකාව කුමන වර්ගයේ ද යන්න මිස, මා විශ්වාස කරන පල්ලිය කුමන වර්ගයේ ද යන්න නො වේ. දෙවැන්න වැදගත් වන්නේ මට පමනකි" යි පැවසී ය. මා විශ්වාස කරන්නේ පල්ලිය හා රාජ්‍යය පරම වසයෙන් ම එකිනෙකින් වෙන්ව තිබෙන්නා වූ ඇමරිකාවකි. එහි ජනාධිපතිට (ඔහු කතෝලිකයෙකු වුවත්) ක්‍රියා කලයුත්තේ කෙසේ දැයි කිසි ම කතෝලික ආගමික නායකයකු විසින් නො කිව යුතු අතර කිසි ම ප්‍රොතෙස්තන්ත්‍ර ඇමතිවරයකු ඔහුගේ ආගම් වාසීන්ට ඡන්දය දිය යුත්තේ කාට දැයි නො කිව යුතු ය..." යි ඔහු ප්‍රකාශ කලේ ය.

08. ඇමරිකාව පිලිබඳව ඔහුගේ සංකල්පය කවරක් ද යන්න කෙනඩි තවදුරටත් විස්තර කලේ ය. "එහි

කිසිදු රාජ්‍ය නිලධාරියෙක් රාජකාරි ප්‍රතිපත්ති පිලිබඳව පාප්වරයා ගෙන් හෝ පල්ලියේ ජාතික කවුන්සලය වෙතින් හෝ වෙනත් පැවිදි සභාවක මූලාශ්‍රයකින් හෝ උපදෙස් නො ඉල්ලිය යුතු අතර එවන් උපදෙස් පිලි නොගත යුතු ය." "එහි කිසිදු ආගමික සභාවක් සිය අභිමතය ඍජුව හෝ වක්‍රාකාරයෙන් පොදු මහජනතාව මත හෝ රාජ්‍ය නිලධාරීන්ගේ කටයුතු මත පැටවීමට උත්සාහ නො කල යුතු ය." "මගේ විශ්වාසය, ආගම පිලිබඳ තමාගේ දෘෂ්ටීන් තමාගේ ම පුද්ගලික දෑ ලෙස සලකන ජනාධිපතිවරයකු පිලිබඳව යි..."

09. පල්ලිය හා රාජ්‍ය අතර සම්බන්ධතාවන් පිලිබඳව 1960 දී දේශපාලන සංස්ථාපිතය තුල පැවති එකඟත්වයේ සැලකිය යුතු සම්ප්‍රදායානුකූල ප්‍රකාශනයක් වන කෙනඩිගේ සඳහන අද දවසේ පෙනී යනු ඇත්තේ මිථ්‍යාදෘෂ්ටියකට නො අඩු දෙයක් ලෙස ය. දේශපාලන ජීවිතයේ ආගමික ඇඟිලි ගැසීමට මෙතරම් නොපැකිල විරුද්ධ විය හැකි එක් ප්‍රමුඛයෙක් හෝ රිපබ්ලිකන් පක්ෂයේ කෙසේ වෙතත් ඩිමොක්‍රැටික් පක්ෂය තුල සිටිතැයි යමෙකුට සිතිය නො හැකි ය. ගබ්සාවන් කිරීම සඳහා කාන්තාවන්ට ඇති අයිතිය ආරක්ෂා කරමින් කෙරී සෙනේට් සභාවේ ඡන්දය දීම නිසා ඩිමොක්‍රැටික් අපේක්ෂකයාට ඡන්දය නො දිය යුතු යයි කතෝලික බිෂොප්වරුන් විසින් සිය ආගමිකයන් වෙත නිකුත් කල උපදෙස් පිලිබඳව අදහස් දක්වන ලෙස එක් විවාදයක දී කෙරීගෙන් ඉල්ලා සිටි විට සැබවින් ම ඔහු සඳහන් කලේ තමන් ඔවුන්ගේ අදහස්වලට "ගරු කරන" බව යි. දේශපාලන වාතාවරනය මෙතරම් නාටකාකාර ලෙස වෙනස් වී ඇත්තේ මන්ද? ආගමික පසුගාමිත්වය හිස එසවීම හා එක්සත් ජනපදය තුල මෑත දශකයන්හි ඇති වූ සමාජ ආර්ථික වෙනස්කම් අතර ඇති සම්බන්ධය කුමක් ද? දශලක්ෂ සංඛ්‍යාත ඇමරිකානු කම්කරුවන් පීඩාවට පත්කල ආර්ථිකය අන්තයට ම අවිනිශ්චිතව තිබීම හා ආගමේ නිතිපතා වැඩෙන බලපෑම අතර යම් සම්බන්ධයක් තිබිය හැකි ද?

10. මෙවන් වූ ප්‍රශ්න කිසි විටෙකත් මතු කර හෝ නැත. තකතිරුකම පැතිරී යාමට තුඩු දුන් ඇමරිකානු සමාජයේ වත්මන් තත්වයන්හි තර්කාන්විත මූලාශ්‍රය සොයා ගැනීමට ඩිමොක්‍රැටික් පක්ෂ නායකයන් විසින් කිසිදු උත්සාහයක් දරන්නේ නැත. ආගමික පුනර්ජීවනය, එහි ප්‍රතිගාමී න්‍යායපත්‍රය තිබියදීත්, ඇමරිකානු දේශපාලන ජීවිතයේ දී නො වෙනස්කල හැකි සාධකයක් ලෙසින් පිලිගත යුතු ය යන තාක් දුරට පමනි ඔවුන් උනන්දු වන්නේ. දේශපාලන ප්‍රතිගාමිත්වයට යටත්වීම සඳහා ආගම ප්‍රයෝජනවත් කඩතුරාවක් සපයන අතර එය ගර්ස්ටේන්ගේ යට සඳහන් ප්‍රකාශයෙන් පරිසමාප්තියට පත්වෙයි. "ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්තීන්ට වඩා ඡන්දදායකයන් ඇදගැනීමේ දී සංස්කෘතිය හා ගතිලක්ෂන වඩාත් වැදගත් වන බව ද මැතිවරනයෙන් සනාථ කලේ ය."

11. ඩිමොක්‍රැටික් පක්ෂයේ බලගතු කොටසකට මග පෙන්වන දර්ශනයේ සංක්ෂේපයක් වන මෙම ප්‍රකාශය අඩු වැඩි වසයෙන් දේශපාලනික දන්ඩනමස්කාරයේ හා බංකොලොත්භාවයේ පරිපූර්න පාපොච්චාරනයකි. "සංස්කෘතිය හා ගතිලක්ෂනය" "ප්‍රතිපත්තීන් හා ක්‍රියාමාර්ගයන්ට" වඩා වැදගත් වන්නේ නම් එවිට දේශපාලන පක්ෂයක අර්ථය කුමක් ද? එක්සත් ජනපද ඉතිහාසයේ වඩාත් අතියම් පිලිබිඹුවෙන් පවා හෙලිදරව් කෙරෙන්නේ ගර්ස්ටේන්ගේ අභූත ස්වභාවය යි. නව ඇමරිකානු සමූහාන්ඩුවේ නිර්මාතෘන්ගේ දැඩි අවධානයෙන් යුතුව ක්‍රියා කරමින් සිටියේ 1776 දී "ප්‍රතිපත්තීන් හා ක්‍රියාමාර්ගයන්ගෙන්" හුස්ම හිරවී තිබූ විජිතයන් ඉන් මුදාගැනීමට යි. වහල්භාවය හා එය අහෝසි කිරීම අතර ගැටුම මත කේන්ද්‍රගත වූ "ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ගයන්" පිලිබඳ ලෝක ඓතිහාසික ගැටුමක් නො වේ නම් ඇමරිකානු සිවිල් යුද්ධය කුමක් වී ද? 1890 ගනන් මැද භාගයේ ජාතික ආර්ථිකය මත වෝල් වීදියේ වැඩෙන අධිකාරයට එරෙහි මහජන විරෝධය ක්‍රියාමාර්ගික ප්‍රකාශනයක් අත්කර ගත්තේ රිදී මත පදනම් වූ මුදලක් සඳහා ඉල්ලීම තුල ය. සියවස අවසානයේ සමාජවාදී ප්‍රවනතාවන්ගේ වර්ධනය වන බලපෑම යටතේ ධනේශ්වර පක්ෂවල ප්‍රතිසංස්කරනවාදී කන්ඩායම්, දැවැන්ත ප්‍රතිපත්තිමය ආරම්භකත්වයන් ද සහිතව "ප්‍රගතිශීලී" ක්‍රියා මාර්ගයක් පෙරට දැමීන.

12. ඊනියා "බුල් මූස්" පක්ෂය ගොඩ නගමින් හිටපු ජනාධිපති තියඩෝර් රූස්වෙල්ට් එවක ජනාධිපති ටාෆ්ට්ගෙන් බිඳී වෙන්වුනු 1912 භේදය ඇතිකිරීමට සෑහෙන තරම් ප්‍රබල ප්‍රතිපත්ති වෙනස්කම් රිපබ්ලිකන් පක්ෂය තුල පවා ඇති වී තිබේ. ඉතා ආකර්ශනීය වූ එම මැතිවරන වර්ෂ ටාෆ්ට්, රූස්වෙල්ට් ඩිමොක්‍රැටික් අපේක්ෂක වුඩ්රෝ විල්සන් හා සමාජවාදී පක්ෂ අපේක්ෂක ඉයුජින් වී ඩෙබ්ස් අතර සිව්කොන් තරගයක් අත්දුටුවේ ය. දේශපාලන විවාදයේ ආධිපත්‍ය දැරුවේ ප්‍රතිපත්ති හා ක්‍රියා මාර්ගයන් පිලිබඳ කරුනු ය. "රිපබ්ලිකානු ඉහල තීරුබදු" "ධනයේ අසමාන බෙදී යාමට තුඩු දුන් ප්‍රධාන කාරනය" හා "ධනවතුන් තවත් ධනවතුන් කරන, දුප්පතුන් තවත් දුප්පත් කරන බදු ක්‍රමයක්" ලෙස එය හෙලා දකින ක්‍රියා මාර්ගයක් වමේ බලපෑම් යටතේ ඩිමොක්‍රැටිකයෝ සිය ජාතික සම්මේලනයේ දී සම්මත කර ගත්හ. එය පුද්ගලික ඒකාධිකාරයට භාරදුන්නේ "සාධාරනය කල නො හැකි හා ඉවසිය නො හැකි" දෙයක් ලෙසින් ය. "ස්ටෑන්ඩඩ් ඔයිල් සමාගම හා දුම්කොල භාරකාරිත්වය සමග සම්මුතිවාදී වී ඇතැයි ද එම සමාගම්වල නිලධාරීන්ට එරෙහිව භාරකාරත්ව විරෝධී නීතියේ අපරාධ කොන්දේසිවල පිහිට පැතීමට අසමත්වීම" ගැන ද එය ටාෆ්ට් පරිපාලනය හෙලාදුටුවේ ය. ජාතික ආදායම් බදු ක්‍රමයක් ද, සෙනේට් සභිකයන් මහජන ඡන්දයෙන් තෝරා ගැනීම ද, අද නම් විප්ලවවාදී යෝජනාවකට අඩු නො වන බව පෙනී යනු ඇති ජනාධිපති තනතුරට

පත්වීම එකවරකට සීමා කල යුතු බවට ද අනුමැතිය පල කලේ ය. "ඕනෑම සමාගමක් මැතිවරන අරමුදලට දායකවීම හා ඕනෑම පුද්ගලයෙකු යම් සාධාරන උපරිමයකට වඩා මුදලින් දායකවීම තහනම් කරන නීති පැනවිය යුතු බව" ඉන් නිර්දේශ කෙරින.

13. 1930 ගනන්වල දී ඩිමොක්‍රටික් පක්ෂය නව සම්මුතිය නම් ක්‍රියාමාර්ගය ද ජොන්සන් ජනාධිපති කාලයේ දී සමාජ ප්‍රතිසංස්කරන සඳහා එහි න්‍යාය පත්‍රයේ අවසන් උත්සාහය ලෙස ශ්‍රේෂ්ඨ සමාජය වැඩපිලිවෙල ද ඉදිරියට ගෙන ගියේ ය. මා මේ අත්දැකීම ගැන සඳහන් කලේ අවසාන විග්‍රහයේ දී ධනේශ්වර අවශ්‍යතාවයන්ට සැමවිට ම කැප වී සිටියා වූ ධනේශ්වර පක්ෂයක් වන ඩිමොක්‍රටික් පක්ෂ ඉතිහාසය හුවා දැක්වීමට නොවන බව අවබෝධ කර ගනු ඇතැයි මම විශ්වාස කරමි. ඩිමොක්‍රටික් පක්ෂය තමන් කම්කරු පන්තියේ අවශ්‍යතාවන් නියෝජනය කරන්නේ ය යන ප්‍රකාශයේ සාවද්‍ය බව ද එහි ප්‍රතිසංස්කරනවාදී අත්හදාබැලීම්වල නො සෑහෙන හා සීමිත ස්වභාවය ද, අවශ්‍යයෙන් ම එහි තිබුනා වූ ධනපති අංග ලක්ෂනයන් ද දැඩි ලෙස විවේචනය කිරීමට එක්සත් ජනපදයේ සමාජවාදී ව්‍යාපාරය එහි ආරම්භයේ පටන් ම සිය බුද්ධිමය ශ්‍රමයෙන් කැප කර ඇත්තේ කුඩා කොටසක් නො වේ. කෙසේ වුව ද ඩිමොක්‍රටික් පක්ෂයේ කුනු වී යාමෙහි ප්‍රමානය අවබෝධ කර ගත හැකි වන්නේ එය අවශ්‍ය ඓතිහාසික සන්දර්භයෙහි තැබීමෙන් පමනකි. එක්සත් ජනපදයේ පුලුල් කම්කරු පන්තියේ අවශ්‍යතාවන් හා ඕනෑඑපාකම් වෙත කිසියම්ම අර්ථභාරී මගකින් පිවිසීමට ඩිමොක්‍රටික් පක්ෂයට ඇති නො හැකියාවේ ද එහි ලිබරල් හා ප්‍රතිසංස්කරනවාදී අතීතය මුලුමනින් ම විරේක කිරීමේ ද සංක්ෂිප්ත ප්‍රකාශනය වන්නේ "ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ගයන්" ගර්ස්ටේන් විසින් පිලිකුල් සහගතව බැහැර කිරීම යි. සත්තකින් ම ඩිමොක්‍රටික් පක්ෂය එවන් උත්සාහයක් දරන්නේ ද නැත. එය ඇත්තේ ඒ සඳහා නො වේ.

14. *සමකාලීන දේශපාලනය පිලිබඳ, කැන්සාස්ට සිදුවී ඇත්තේ කුමක් ද?* නම් වූ සිය ජීවමාන හා ආකර්ශනීය අධ්‍යයනය තුල තෝමස් ෆ්‍රෑන්ක් ඩිමොක්‍රටික් පක්ෂයේ සමාජ යොමුව හා න්‍යාය පත්‍රය ගැන මෙම සංක්ෂිප්ත විස්තරය ඉදිරිපත් කරයි:

"බිල් ක්ලින්ටන්, අල් ගෝර්, ජෝ ලිබර්මාන් හා ටෙරී මැක්ඕලිෆ් වැන්නවුන් ඉදිරියට ගෙන ආ සංවිධානය වන ඩිමොක්‍රටික් පක්ෂ නායකත්වය මන්ඩලය (ඩීඑල්සී) දිගුකලක් තිස්සේ නිල් කරපටිකාර ඡන්දදායකයන් අමතක කර ඒ වෙනුවට සමාජ ප්‍රශ්න පිලිබඳව ලිබරල්වාදී වන ඉසුරුමත් වෘත්තීය සුදුකරපටිකාරයන් බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමට පක්ෂය මෙහෙයවා ඇත. ඩීඑල්සීයේ මහත් ම අවශ්‍යතාවය වී ඇත්තේ සංවිධිත කම්කරුවන්ගෙන් මැතිවරන අරමුදලට ලැබෙන යම් දායකත්වයක් බෙහෙවින් ඉක්මවා යෑමේ හැකියාවෙන් යුත් සමාගම් වෙත ස්නේහය පෑමේ උවමනාව යි. නව ඩිමොක්‍රටිකයන් සිතන්නේ ඡන්ද හා වඩාත් වැදගත් වන මුදල් එකතු කිරීමේ දී එයට මාර්ගය මෙම බඩජාරී ගනුදෙනුකරුවන් බව යි. ඒ සඳහා ආර්ථික කරුනු, ශුභසාධන, නැෆ්ටා (උතුරු ඇමරිකානු නිදහස් වෙලෙඳ ගිවිසුම) සමාජ ආරක්ෂන, කම්කරු නීති, පුද්ගලීකරනය, ව්‍යවසායන් විසුරුවා දැමීම හා ඉතිරි සියල්ල සඳහා නිමක් නැති සහන පිරිනැමීමේ පැරනි පුරුද්ද මත ගලක් මෙන් තදින් සිටගත යුතු බව යි. එවන් ඩිමොක්‍රටිකයන් තමන් සමච්චල් කරන "පන්ති යුද්ධය" පැහැදිලිවම ඉවතලන අතර ව්‍යාපාරික අවශ්‍යතාවන්ට තමන්ගේ ඇති මිත්‍රත්වය අවධාරනය කිරීමට මහත් වෙහෙසක් දරති. කොන්සර්වේටිව්වරු මෙන් ම ඔවුන් ද ආර්ථික කරුනු මේසයෙන් ඉවතට දමති. ඩීඑල්සී ය ගනන් බලන්නේ මෑතක වන තුරු ම පක්ෂයේ කොඳු නාරටිය වූ කම්කරු පන්තියේ ඡන්දදායකයන්ට යෑමට වෙන තැනක් නොමැති බව යි. එනම් ඩිමොක්‍රටිකයන් රිපබ්ලිකානුන්ට වඩා ආර්ථික ප්‍රශ්නවල දී ආන්තික වසයෙන් සෑම විටම හොඳ විය. ඒ හැරත් මෙම, ජයග්‍රහනය වන්දනාමාන කරන රටෙහි දුප්පතාගේ හඬ බවට පත්වීමේ සැබෑ උවමනාවක් ඇති දේශපාලකයා කවරෙක් ද? ඒ සඳහා මුදල් ඇත්තේ කොහේ ද?"

15. එය වෙනස් ලෙසකින් කිවහොත් පක්ෂයේ නියම ආධාරකරුවා ඩිමොක්‍රටිකයන් පරිකල්පනය කරන ආකාරයට සමාජ හෘදසාක්ෂිය සහිත ව්‍යාපාරවස්තු ගනුදෙනුකරුවෙකි.

16. කෙරීගේ ගැටලුව වූයේ ඕනෑවට වඩා ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති නොව ඇත්තටම කම්කරු පන්තික ඇමරිකානුවන් පොරබදන දැවැන්ත ගැටලුවලට ඇමතීමේ කිසිදු බැරෑරුම් යෝජනාවකින් හෝ තොර වීමයි. ඔහුගේ සමස්ත මැතිවරන ව්‍යාපාරයම මගහැරීමේ, වක්‍රෝත්තියේ, වැනෙන සංඥාවන්ගේ හා දෙපිටකාට්ටුකමේ වේදනාකාරී හා දිග්ගැස්සුන අභ්‍යාසයක් විය. ඩිමොක්‍රටික් පක්ෂයේ පොදු ජනතා පදනමට පිදුන සෑම සහනයක්ම නො සැලෙන සේ තුලනය කල සහතිකයක් ඔහුගේ ව්‍යාපාරික අනුග්‍රාහකයන් වෙත ද නිකුත් කර තිබේ. ඉරාක යුද්ධය පිලිබඳව කෙරී ප්‍රමාද වී කල විවේචනයන් "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ට නොසැලී සහාය දීමේ ඔහුගේ උද්වේගකර ප්‍රකාශනයන් සමග එකට පැවතියේ ය. ඔව් ඔහු මහා ධනවතුන්ගේ බදු වැඩිකිරීමට එකග ය. එහෙත් සොච්චමකින් ය. ඔව් ඔහු තීරනාත්මක සමාජ වැඩිපිලිවෙලවල් ආරක්ෂා කිරීමට පෙනී සිටියි. එහෙත් එසේ වන්නේ ඒවාට "යොදා ගන්නා විට ගෙවීමේ" පදනම මත පිරිවැය සාධාරනය කලහැකි නම් පමනකි එසේ වන්නේ. කෙරීගේ ව්‍යාපාරයට ආදර්ශ පාඨයක් තිබුනේ නම් එය "පරම වසයෙන් එහෙත් යථාවසයෙන් නොවේ" යයි විය යුතුව තිබුනි. රිපබ්ලිකානුවන්ට සිය විරුද්ධවාදියාගේ දුබල කම හා ඔහුග් බෙල්ලට ගැසීමට ඇති හැකියාව ගැන නො වරදින ඉවක් තිබුනු අතර "කාසිය උඩදමන්නෙක්"

ලෙස ඔහුට විරිත්තීමේ දී තමන් කරන්නේ කුමක් දැයි හොඳින් දැන සිටියහ. පැහැදිලිව යමකට පක්ෂ ද විපක්ෂ ද යන්න ගැන කීමේ දී කෙරීගේ දක්නට තිබුනු නො හැකියාව පෙන්නුම් කලේ සරලව ඔහුගේ ම අතීරනය නොව ඇත්තවසයෙන්ම තමන් "ජනතාවගේ පක්ෂය" ලෙස හඳුන්වා ගන්නා අතරතුර සිය ව්‍යාපාරික හාම්පුතුන්ගේ අවශ්‍යතාවන් වෙනුවෙන් සුවච ලෙස සේවය කරන සංවිධානයක් වූ ඩිමොක්‍රැටික් පක්ෂයේ ම මූලික විසංවාදය යි.

17. ඇමරිකානු දේශපාලන ජීවිතයේ අමුතුම සාධක අතුරින් එකක් පිලිබඳව මෑත කාලයේ සැලකිය යුතු සාකච්ඡා වටයන් පැවැත්වී තිබේ. විශේෂයෙන් ම දකුනේ හා සම්ප්‍රදායික දේශසීමා ප්‍රදේශයන්හි කැන්සාස්, මිසෝරි, කෙන්ටුකි, ටෙනසී හා බටහිර වර්ජිනියා ප්‍රාන්ත වැනි රිපබ්ලිකානුවන්ට ඡන්දය දුන් ප්‍රාන්ත බොහොමයක් එක්සත් ජනපදයේ අතිශයින්ම දුගී ජනයා ද අතරට ගැනේ. මෙම ප්‍රාන්ත රාජ්‍යයන්හි ජනතාව මත රිපබ්ලිකානු ආර්ථික ප්‍රතිපත්තීන් විසින් ඇති කල බලපෑම විනාශකාරී විය. සංඛ්‍යා ලේඛන මෙය එලියට ගනියි. ඉහලම දුගී අනුපාතිකයන්, අපරාධ අනුපාතයන්, දික්කසාද අනුපාතයන් (ආගමේ පැතිර තිබෙන බලපෑම තිබියදී ම නැතහොත් ඒ නිසා ම යයි අප කිව යුතු) හා සමාජ කාලකන්නිකම හා සන්තාපය පිලිබඳ අනෙකුත් දර්ශකයන් බුෂ්ට ඡන්දය දුන් රාජ්‍ය තුල දී සොයාගත හැකි ය. ඒවායේ ඡන්දදායකයන් රිපබ්ලිකානුවන්ට සහාය දැක්වූයේ ඔවුන්ගේ ම සැබෑ ද්‍රව්‍යමය අවශ්‍යතාවන්ට වඩා "වටිනාකම්වලට" වැඩි ලැදියාවක් දැක්වීම නිසා බව කියා පෑම විද්‍යාත්මක සමාජ දේශපාලන විශ්ලේෂනයකට ආදේශකයක් ලෙස ගුඪවාදය යොදාගැනීමකි.

18. කිසිවෙකුටත් නිශ්චිත අර්ථයක් පැහැදිලි කර නොදෙන "වටිනාකම්" ගැන කෙරෙන වියුක්ත සඳහන් කිරීම් කම්කරුවන් රිපබ්ලිකන් පක්ෂයේ හා එහි පරිවාරක ආගමික වාචාලයන්ගේ ද බකතපසුන්ගේ ද බලපෑම යටතට පත්වූයේ කෙසේ දැයි විස්තර කෙරෙන්නේ අල්ප වසයෙනි. වඩාත් ඒත්තු ගතහැකි පැහැදිලි කිරීම වන්නේ එක කලක දී සටන්කාමී වෘත්තීය සමිතිවාදයේ කුලුනු වසයෙන් පැවති රාජ්‍යයන්ගේ පැරනි කම්කරු ව්‍යාපාරයෙහි පරිපූර්න බිඳ වැටීමෙන් සිය අවශ්‍යතාවන් ආරක්ෂා කර ගැනීමටත් සමාජ ගැටලු සමග පොරබැදීමටත් කිසිදු මාධ්‍යයක් නොමැතිව මිලියන ගනන් කම්කරුවන් අතහැර දමා තිබීමයි. ඇමරිකානු කම්කරු පන්තියේ එක කොටසකගේ පමනක් සමාජ අත්දැකීම් අප සැලකිල්ලට ගෙන බලමු. 20 වැනි සියවසේ වැඩි කොටසක් පුරා යූඑම්ඩබ්ලිව්ඒ තුල සංවිධානය වූ ගල් අඟුරු පතල් කම්කරුවන්ගේ අරගල බටහිර වර්ජිනියාවේ ද කෙන්ටුකිහි ද වර්ජිනියාව, ටෙනසි අරකන් සාස්, ඔහායෝ හා ඉන්ඩියානාහි සැලකිය යුතු කොටසක් පුරා පවා ඇවිලී ගියේ ය. ඇමරිකානු කම්කරු පන්තියේ වඩාත් ම පන්ති සවිඥ්ඥානකත්වයෙන් යුත් කොටස විවාදාත්මකව ගල් අඟුරු පතල් කම්කරුවන් ය. ජෝන් එල් ලෙවිස් කියා සිටිය හැකි පරිදි ඔවුන් "මනා මැදහත්භාවයෙන් යුතුව" යෝධ පතල් සමාගම් සමග සටන් වැදුනේ අවස්ථා ගනනාවක දී ම ධවල මන්දිරය ද නොතකා හරිමින් ය. එහෙත් 1980 ගනන්වල දී වෘත්තීය සමිති නිලධරයේ ද්‍රෝහිත්වය ප්‍රධාන කොට ම වගකිව යුතු පරාජයන් මාලාවකට පතල් කම්කරුවන් මුහුන පෑ අතර එමගින් යූඑම්ඩබ්ලිව්ඒය නො වැදගත් හිස් කටුවක් බවට පත් විය. දහස් ගනනක් පතල් කම්කරු රැකියා අතුගා දමනු ලැබුනි.

19. රැකියා අහිමි කරන ලදුව හා පරම්පරා ගනනාවක අරගලවලින් පෝෂනය කෙරුනු පන්ති සවිඥ්ඥානකත්වයකින් යුත් ගැඹුරට මුල්බැසගත් සමාජ සම්බන්ධතාවලින් කපා හරින ලදුව තමුන් අතරමං කල වෘත්තීය සමිතියකින් හුදෙකලා කෙරුනු, පෙරදින සටන්කාමී කම්කරුවෝ නිරතුරුව ම නව ගනුදෙනුකරුවන් සොයමින් සිටින එවැන්ජලික කර්මාන්තයෙහි හොඳින් පුහුනු කල වන්දිභට්ටයන්ට අවනත වූහ. සංවිධානය වූ කම්කරු ව්‍යාපාරයක පරිසරයෙන් මුලුමනින් ම වියෝවී හැදී වැඩුනු හා පන්ති අරගලයේ සම්ප්‍රදායන් පිලිබඳ දැනුවත්කමෙන් අඩු හෝ එවන් දැනුවත්කමක් කිසිසේත් ම නොමැති එවන් කම්කරුවන්ගේ දරුවන් සම්බන්ධයෙන් නම් පන්ති සවිඥ්ඥානකත්වයේ වර්ධනයට බාධාවන් බොහෝ ය. *මෙම ලෝකය තුල හා ඔවුන්ගේ ජීවිත කාලය තුල* වඩාත් හොඳ හා මිනිස්කම් සහිත සමාජයක් පිලිබඳ හැඟීම පසෙක තැබුවත් සමකාලීන සමාජය පිලිබඳව විවේචනාත්මක ආකල්පයක් වැඩී ඒමට පහසුවන තොරතුරු හා අභ්‍යන්තර ඥානයක් අත්කර ගත හැක්කේ කුමන මූලාශ්‍රයකින් ද? සහතිකෙන් ම පවතින්නා වූ දේශපාලන පක්ෂවලින් හෝ ජනසංනිවේදන මාධ්‍යවල නරාවලෙන් නම් නො වේ.

20. ජනසන්නිවේදන මාධ්‍ය හා රිපබ්ලිකන් දේශපාලන යන්ත්‍රනය විසින් ඔහු හෝ ඇය නිර්දය ලෙස යටත් කරනු ලැබීමෙන් ප්‍රචාරනය විසින් සාමාන්‍ය ඇමරිකානු කම්කරුවා මිලට ගන්නේය යන්නක් අදහස් නොවේ. නැත. කිසිසේත් ම නැත. දේවල් පවත්නේ ඒවා තිබිය යුතු පරිද්දෙන් නොවන බව හඳුනාගැනීමට තරම් සෑහෙන ජීවිතයක් ඔවුන් ගතකර තිබේ. කම්කරුවෙක් "වටිනාකම්" ගැන කථා කරන විට ඔහු සඳහා එයට ඇත්තේ එන්රොන් සමාගමේ කෙනත් ලේ හෝ ජෝර්ජ් බුෂ්ට වඩා බොහෝ වෙනස් අර්ථයකි.

21. 2004 මැතිවරනය තුල "වටිනාකම්" ප්‍රශ්නයෙහි වැදගත්කම ප්‍රශ්නයට බඳුන් කරන බොහෝ වාර්තාවන් දැනට මත් එලිමහනට පැමින තිබේ. මුල්ම පශ්චාත් මැතිවරන ප්‍රකාශවලට පදනම් වූ ඡන්ද මධ්‍යස්ථාන දත්ත එක්කෝ නොමග යවන සුලු හෝ වැරදි ලෙස අර්ථකථනය කල බව දැන් පෙනෙන්නට තිබේ. ප්‍රශ්නය මෙය බව මට සහතික ය. එහෙත් නියම වැදගත් කරුන විය යුත්තේ "වටිනාකම්" ප්‍රශ්නය මතු වී ආවේ වැඩ

කරන ඇමරිකානුන් පුලුල් සමූහයකගේ අව්‍යාජ සමාජ, ආර්ථික හා දේශපාලන අවශ්‍යතාවන් එක පක්ෂයක් විසින් හෝ නියෝජනය නො කිරීමෙන් නිර්මානය කල දේශපාලන රික්තයක් තුල වීමයි. ඇමරිකානු ධනවාදයේ මහිමය පිලිබඳව මහත් උද්යෝගයෙන් ගැයෙන ගීතිකාවන්හි එක් දැවැන්ත ගායන වෘන්දයක එකිනෙකට වෙනස් වූ කොටස් ඩිමොක්‍රැටිකයන්, රිපබ්ලිකානුවන් සහ ජනමාධ්‍යයන් විසින් නිර්මානය කෙරින.

22. මෙය කාඩ් කුට්ටමක් අනන්නාක් මෙන් පුද්ගලයින් යලි ඇනීමෙන් හෝ වඩා හොඳ අපේක්ෂකයන් බඳවා ගැනීමෙන් ජයගත හැකි තාවකාලික දුබලකමක් නො වේ. ඒ වනාහි, ඇමරිකානු ධනවාදයේ පරිනාමයෙහි, එනම්, සාපේක්ෂ වසයෙන් අතලොස්සක් අත අත්‍යසාමාන්‍ය ලෙස ධනය ඒකරාශී වීමෙහි සමාජ අසමානතාවයෙහි ආන්තික මට්ටම්හි ද, සමාජ ප්‍රතිසංස්කරනවාදය සඳහා සැලකිය යුතු ඡන්ද පදනමක් සකස් කලා වූ හා එක් අවධියක දී කම්කරුවන් හා ධනපතීන් අතර ඇති වූ පන්ති අරගලයේ බෙිරුම්කරුවන් ලෙස සේවය කල සම්ප්‍රදායික "මධ්‍යම පන්තියේ" වේගවත් පරිහානියේ ද, අවසාන වසයෙන්, සම්ප්‍රදායික ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී පාලන රූපයන් පවත්වා ගෙන යාමට බැරැරුම් ව කැප වූ කවර හෝ කොටසක් පාලක ප්‍රභූව තුල සිටියේ නම් ඔවුන් එය තුලම අතුරුදහන් වී යාමේ ද නිෂ්පාදිතයකි.

23. ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය ජරපත්වීමේ මෙම ඉතා ඉහල අවධිය, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ව්‍යාප්තිය සමග අත්‍යන්තයෙන් බැඳී ඇති අතර එය විදේශ රටවල් ප්‍රචන්ඩ ලෙස කොල්ලකෑමෙන් පමනක් නොව එක්සත් ජනපදය තුල ම සියලු සම්ප්‍රදායික ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයන් අභ්‍යන්තරයෙන් ම ඛාදනය වීම තුලින් ද විද්‍යමාන වෙයි. එක් අතකින් හෝ වෙනත් අතකින් පාලක ප්‍රභූවේ සෑම කොටසකම සහ එහි ඉහල-පන්තික සමාජ වාටියේ සැලකිය යුතු කොටසක පෞද්ගලික ධනය හා පොදු ද්‍රව්‍යමය අවශ්‍යතාවන් රැඳී පවත්නේ ලෝක ධනේශ්වර ආර්ථිකයේ ඇමරිකානු ආධිපත්‍යය මත ය. එක්සත් ජනපදයේ මූලෝපායික ගෝලීය අරමුනු මුදුන් පත් කර ගැනීමට ආක්‍රමනකාරීව මිලිටරිය යොදාගැනීමේ දී ඊට සහාය දක්වන පාලක ප්‍රභූවේ පුලුල් කොටස් තුල පවත්නා වූ එකඟතාවකට පදනම සැකසෙන්නේ මේ මගිනි.

24. ඉරාක ප්‍රශ්නය මැතිවරන ව්‍යාපාරය අතරතුර කිසිවිටෙකත් මතු නො කිරීමේ වගකීම ඩිමොක්‍රැටික් පක්ෂයේ ප්‍රධාන මූලෝපායඥයන් වෙත පැවරී තිබුනි. හොවාඩ් ඩීන්ගේ ඩිමොක්‍රැටික් නාමයෝජනා අපේක්ෂාව බිඳ වැටීමෙන් පසුව කෙරීගේ හා ඔහුගේ උපදේශකයන්ගේ අභිලාශය වූයේ ඉරාකයක් නො පැවති බව ඇඟවෙන ලෙස කටයුතු කිරීම යි. සමස්තයක් ලෙස ඊනියා "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" පසෙක තිබියේවා, ඉරාක ආක්‍රමනය ගැන හෝ කිසිදු විවේචනයක් නො තිබිය යුතු ආක්‍රමනයට එරෙහිව කථා කිරීම ප්‍රතික්ෂේප කිරීමේ කෙරීගේ තීන්දුව මත ඩිමොක්‍රැටික් ආධාරකරුවන් අතර පැවති මුලාව පහවී යාම විශාල වසයෙන් පිලිබිඹු කරමින් ඩිමොක්‍රැටික් පක්ෂ සමුලුවෙන් පසුව කෙරීගේ ඡන්ද සහයෝගීතාව නාටකාකාරව පහල වැටී තිබිය දී පවා ඔහු නිශ්ශබ්දව සිටියේ ය.

25. ප්‍රමුඛ පෙලේ රිපබ්ලිකානුවන් ගනනාවක් ම බුෂ්ගේ ඉරාක යුද මෙහෙයුම විවේචනය කිරීමට ඉදිරියට පැමිනි සැප්තැම්බර් මැද භාගයේ ඉරාක වියවුල තෙක් ම කට පියාගෙන සිටි කෙරී, ජනාධිපති ව්‍යාපාරයේ දී පාලක ප්‍රභූවේ ආස්ථානයෙහි සිට යුද්ධය බුෂ්ට එරෙහිව යොදා ගැනීමට දැන් දේශපාලන යුක්ති සහගත බවක් ඇති වී තිබෙන බව තීරනය කලේ ය. එවිට දී පවා බුෂ්ගේ ඉරාක ආක්‍රමනයෙහි "නොමේරූ" ස්වභාවය ගැන සිය විවේචනයන්ගෙන් ඉරාකයෙන් ඇමරිකානු හමුදා ආපසු කැඳවීමට තමාගේ එකඟතාව පලකිරීමෙන් හෝ තේරී පත්වුවහොත් එයට අනුමැතිය දෙන්නේ ද යන්නෙන් වෙන් කොට තැබීමට කෙරී ප්‍රවේසම්සහගත විය. කෙරී තේරී පත්වුව ද පසුගිය සතියේ පල වූ ලේවැකි ශීර්ෂ පාඨයන්හි කිසිදු වෙනසක් සිදු නොවනු ඇත. ඔහු කිසිදු විවේචනයක ඇඟවීමකින් පවා තොරව ෆලූජා වෙත එල්ල කල ප්‍රහාරය අනුමත කරනු ඇත. ඇමරිකාවේ ඉරාක මිලිටරි ග්‍රහනය සඳහා වඩා පුලුල් සහයෝගයක් යුරෝපීය ආන්ඩු වෙතින් ලබාගැනීමට නිශ්චිත උපායික ගැලපීම් සමහරවිට ක්‍රියාවට නගමින් වුව ද කෙරී පරිපාලනය යටතේ ඇමරිකානු ජාත්‍යන්තර ප්‍රතිපත්තියෙහි මූලික ගමන කිසිදු වෙනසකින් තොරව ම ඉදිරියට යනු ඇත.

26. මැතිවරනය අවසන්වීමෙන් පසුව අනාගතය පිලිබඳ අවිනිශ්චිත භාවය හා සැකසංකාවන් මධ්‍යයේ දේශපාලන ජීවිතය මෙතෙක් පැවති ආකාරයට නො පවතිනු ඇතැයි ද හැරීම් ලක්ෂයක් කරා ලඟා වී ඇතැයි ද යන හැඟීමක් පලල්ව පැතිර පවතී. ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ ඓතිහාසික අර්බුදයේ පෙරනිමිති විවිධාකාර හා ඒවායේ පැතිරෙන සුලු ස්වභාවය ප්‍රතික්ෂේප කිරීමට හෝ වසං කිරීමට නො හැකි තරම් අසංඛ්‍ය වන අතර පද්ධතිය ඒ තුලින්ම නිවැරදි කල නො හැකි ය යන්න ඕනෑවටත් වඩා පැහැදිලි වී තිබේ. ඇමරිකානු ධනවාදයේ අර්බුදය, එක්සත් ජනපදයේ වැඩ කරන මහාජන සමූහයේ මැදිහත්වීම හරහා, අව්‍යාජව ම ප්‍රජාතන්ත්‍රවාදී හා ප්‍රගතිශීලී වූ නව පදනමක එනම් සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත, නො විසඳනු ලබන්නේ නම් සමස්ත ග්‍රහලෝකයම වෙලා ගත් ව්‍යසනයක තර්ජනයට එය මුහුන දෙනු ඇත.

27. 2004 මැතිවරන සෝලියෙන් උකහාගත යුතු නිශ්චිත දේශපාලන නිගමන තිබේ. පලමු වැන්න නම් ඇමරිකානු කම්කරු පන්තියේ ඉරනම සංගත පාලිත ද්වි පක්ෂ ක්‍රමයේ, විශේෂයෙන් ම ඩිමොක්‍රැටික් පක්ෂයේ, දුගඳ හමන මලකුනට ගැට ගසා තැබෙන

අවසාන මැතිවරනය වන බව ය. ඇමරිකානු කම්කරුවන් සම්බන්ධයෙන්, දේශපාලන ප්‍රඥාව ඇරඹෙන්නේ, ඔවුන්ගේ පන්ති අවශ්‍යතාවන්, ව්‍යාපාරික අවශ්‍යතාවන්ට ගැතිකම් කරන හා එමගින් පාලනය වන්නා වූ පක්ෂයක මාධ්‍ය හරහා, සාක්ෂාත් කර ගත නො හැකි බවත්, කම්කරුවන් හමුවේ වඩාත් තදින් දැනෙන කාරනය, සිය අවශ්‍යතාවන් හා අපේක්ෂාවන් පැහැදිලිව නියෝජනය කරන්නා වූ ක්‍රියා මාර්ගයකින් හා ව්‍යාපාරයකින් සන්නද්ධ වූ, තමන්ගේ ම පක්ෂයක් තුල, දේශපාලනිකව ස්වාධීන බලවේගයක් ලෙස සංවිධානය වීමේ අවශ්‍යතාවය තේරුම් ගැනීමෙනි.

28. ඓතිහාසිකව නිරීක්ෂනය කල විට ඇමරිකානු කම්කරු ව්‍යාපාරයේ මහත් ම දුබලකම ඩිමොක්‍රටික් පක්ෂයට එහි යටත්වීම ය. මෙම සන්ධානය, වෘත්තීය සමිති නිලධරය තුලින් ද, ලිබරලුන් වෙතින් ද විවිධාකාර රැඩිකල් ප්‍රවනතාවන්ගෙන් ද පැනනැංගා වූ විවිධ මෝස්තරයේ දේශපාලන අවස්ථාවාදීහු, ඩිමොක්‍රටිකයන් "කම්කරුවාගේ මිතුරන්" ය , සමාජ ප්‍රතිසංස්කරනවලට ඔවුන්ගේ කැපවීමෙන් කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සුරක්ෂිත කෙරෙනු ද, ජීවන මට්ටම් ඉහල නංවනු ද ඇතැ යි කියාපෑම මගින් යුක්තිසහගත කලහ.

29. මුල්කාලීන ඓතිහාසික අවධියක දී මෙම කියාපෑම් බොහෝ කම්කරුවන්ට පෙනුනේ තර්කාන්විත ලෙස ය. 1929 කඩාවැටීමෙන් පසුව ජීවත් වූ පරම්පරාවක් ම කම්කරුවන්ට ද මධ්‍යම පන්තියේ විශාල කොටස්වලට ද හර්බට් හුවර්ගේ සිට ෆ්‍රෑන්ක්ලින් රූස්වෙල්ට් කරා සිදු වූ පරිවර්තනය බලගතු වෙනසක් නියෝජනය කලේ ය. ලිබරල් ඉතිහාසඥයකු වන කනිෂ්ඨ ආතර් ස්ලෙසිංගර්ගේ වැකියට අනුව "නව සම්මුතියේ පැමිනීම" කාලයක් තිස්සේ කෝටි ගනන් ඇමරිකානුවන්ගේ ජීවන තත්වයන්හි විශාල වර්ධනයක් ඇති කලා වූ සමාජ ප්‍රතිසංස්කරනයේ යුගයක ආරම්භය සලකුනු කලේ ය. හිඟ අයවැය, කෘෂිකර්මයට මිලෙන් තල්ලුව දීම, කම්කරුවන් සංවිධානය වීම හා සමිතිවලට බැඳීමේ අයිතිය, කෙරේ ආන්ඩුවේ නිල පිලිගැනීම, සමාගම්වල ව්‍යාපාරික කටයුතු මත නිශ්චිත නීතිමය සීමාවන් පැනවූ නියාමන ආයතන පිහිටුවීම වැනි - 1933ට පෙර "ලෙසෙෆයා" (රාජ්‍ය නිර්බාධවාදී) ධනවාදය සමග එකිනෙකට නො ගැලපෙන්නේ යයි ප්‍රතික්ෂේප කල පියවරයන් ගැනීම මගින් එක්සත් ජනපද සමාජ වාතාවරනයේ ප්‍රගාඪ වෙනස්කම් සලකුනු කලේ ය. එහෙත් රූස්වෙල්ට් විප්ලවවාදියෙක් හෝ සමාජවාදියෙක් නො වී ය. ප්‍රතිසංස්කරනය නො කල හොත් 1930 ගනන්වල අර්බුදයෙන් ධනවාදය ගොඩ නො එනු ඇතැයි අවබෝධ කොට ගත් ඔහු ඇත්තටම නම් දක්ෂ, දුරදක්නා ධනේශ්වර දේශපාලන නායකයෙක් විය.

30. කෙසේ වුව ද එක්සත් ජනපදය තවමත් දැවැන්ත ආර්ථික සම්පත් සතුව සිටියේ ය යන කාරනය නො වන්නට රූස්වෙල්ට්ගේ "නව සම්මුතිය" හි අත්හදා බැලීම් කල නො හැකි වන්නට තිබුනි. පන්ති සම්මුතියේ හා සහන සැලසීමේ ක්‍රියාවලියක් දරාගත හැකි ප්‍රමානවත් මූල්‍ය සම්පත් එය සතු විය. එහෙත් එහි දී පවා, නිසැකවම අවංක වූ රූස්වෙල්ට්ගේ අභිලාෂය, එනම් වඩාත් සාධාරන සමාජයක් ගොඩනැගීම, ධනවාදයේ යථාර්ථයන්ට එරෙහිව ගමන් කලේ ය. 1944 දී ඔහුගේ රාජ්‍ය තත්ව වාර්තාව ඉදිරිපත් කරමින් රූස්වෙල්ට් දෙවැනි අයිතිවාසිකම් පනත සකස් කිරීමට කැඳවුම් කලේ ය. "ඒ යටතේ සමාජ තත්වය, වර්ගය හෝ විශ්වාසය නො තකා සියල්ලන්ගේ ම සුරක්ෂිත භාවය හා ඉසුරුමත් බව සඳහා වූ නව පදනම ගොඩනැංවිය හැකි ය." එක්සත් ජනපදය විසින් එහි සියලු පුරවැසියන්ට සහතික කල යුතු ආර්ථික හා සමාජ අයිතීන් අතර "ප්‍රතිලාභ සහිත හා ප්‍රයෝජනවත් රැකියාවක් සඳහා අයිතිය" "ප්‍රමානවත් ආහාර, ඇඳුම් පැලඳුම්, හා විනෝදය සපයා ගැනීම සඳහා සෑහෙන තරම් උපයාගැනීමේ අයිතිය", "සෑම පවුලකට ම, ගැලපෙන්නා වූ නිවසකට ඇති අයිතිය", "හොඳ සෞඛ්‍ය තත්වයක් ලබාගැනීමට ප්‍රමානවත් සෞඛ්‍ය පහසුකම් හා විනෝදවීමට අවස්ථාවක් ලැබීමේ අයිතිය", "විරැකියාව, හදිසි අනතුරු, රෝගාතුර වීම ආදියෙහි දී වයස්ගත වූ පසුව ඇතිවන ආර්ථික දුෂ්කරතාවන්ට ප්‍රමානවත් ආරක්ෂාවක් ලැබීමේ අයිතිය" හා "මනා අධ්‍යාපනයක් සඳහා ඇති අයිතිය." විය. "මෙම ආර්ථික අයිතිවාසිකම් පනත ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන් සොයා බලන ලෙස - එසේ කිරීම නියත වසයෙන් ම කොන්ග්‍රසයේ වගකීම වෙයි" රූස්වෙල්ට් කොන්ග්‍රසයෙන් ඉල්ලා සිටියේ ය.

31 රූස්වෙල්ට්ගේ දෙවැනි අයිතිවාසිකම් පනත කවර කලෙක වත් නීතිගත නො වූ අතර සෑම පුරවැසියෙකුට ම හිමි විය යුතු අයිතීන් යයි ඔහු ඉදිරිපත් කල යෝජනාවන් ද කිසි කලෙක සාක්ෂාත් නො වී ය. 1945 රූස්වෙල්ට්ගේ අභාවයෙන් පසු ගත වූ දශක තුන ඇමරිකානු ධනවාදයේ දැවැන්ත ප්‍රසාරනයක් අත්වින්දේ දෙවැනි ලෝක යුද්ධයෙන් නැගී ආ ප්‍රබලම ආර්ථික බලවතා හා ලෝකයේ ධනවත් ම රාජ්‍ය ලෙස ය. තව ද එවන් උපරිම කොන්දේසි යටතේ වුවත් රූස්වෙල්ට්ගේ දෘෂ්ටිය ඇමරිකානු ධනවාදයේ අනුල්ලංඝනීය ආර්ථික අවශ්‍යතාවන් සමග ප්‍රතිසන්ධාන ගත කල නො හැකි විය. විසි වසරකට පසුව ජනාධිපති ලින්ඩන් ජොන්සන් සමාජ ප්‍රතිසංස්කරනයේ අභිලාෂවත් න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන ගිය අවසන් නායකයා වසයෙන් "ශ්‍රේෂ්ඨ සමාජය" ක්‍රියාවට නැගීමේ ඔහුගේ යෝජනා එලිමහනට ගෙන ආවේ ය. එහෙත් ඒ වන විටත් එක්සත් ජනපද ධනවාදයේ භූගෝලීය තත්වය පහත වැටෙමින් එහි වෙලඳ ශේෂයේ පිරිහීම හා ඩොලරයේ දුර්වලවීම අත්විඳිමින් සිටියේ ය. වියට්නාම් යුද්ධය අතිරේක බරක් ෆෙඩරල් අයවැය මත පැටවූ අතර සමාජ ප්‍රතිසංස්කරනයේ අභිලාෂවත් ක්‍රියාමාර්ග පෙරට ගෙනයාමේ දී එහි මූල්‍ය පදනමට නාටකාකාර ලෙස

යටින් වල කැපී ය. “ශ්‍රේෂ්ඨ සමාජය” ලදරුවියේදී ම මියැදුනි.

32. ජොන්සන් “ශ්‍රේෂ්ඨ සමාජය” සම්ප්‍රාප්තිය ප්‍රකාශයට පත් කල තැන් පටන් ගත වූ හතලිස් වසර තුල බලයට පත් රිපබ්ලිකන් හා ඩිමොක්‍රැටික් ජනාධිපති පරිපාලනයන්, එක හා සමානව ම උත්සාහ කලේ ශ්‍රේෂ්ඨ සමාජය මෙන් ම නව සම්මුතියෙන් ඉතිරිව තිබෙන නීත්‍යනුකුල භාවයේ යම් හෝ දෙයක් වේ නම් එයට යටින් වලකැපීමට හා බිඳ විසුරුවා හමැරීමට යි. සමාජ හා දේශපාලන ක්‍රියාවලියේ මෙම ප්‍රතිගාමිත්වය ඒ හෝ මේ ජනාධිපතිවරයෙකුගේ දුෂ්ඨ අරමුනුවල ප්‍රතිඵලය ලෙස ප්‍රමානවත් තරම් පැහැදිලි කිරීමට නුපුලුවන. එහි සැබෑ හේතුව පවතින්නේ ධනේශ්වර ක්‍රමයේ වෛෂයික විසංවාදයන් තුල ය.

33. ලෝක ධනවාදයේ මධ්‍ය ලක්ෂ්‍යය වන එක්සත් ජනපදය තුල වර්ධනය වන දේශපාලන ආතතීන් නිෂ්පාදන මාධ්‍යයන්හි පුද්ගලික අයිතිය මත ද එකිනෙක මත රැඳී තිබුන ද අන්‍යොන්‍යව සතුරු ජාතික රාජ්‍යයන්ගේ සැකිල්ල තුල, ජාත්‍යන්තරව සංවිධානය වී තිබීම මත ද රඳා පවතින්නා වූ සමාජ ආර්ථික ක්‍රමයේ සැබෑ බිඳවැටීමෙහි පෙරනිමිති ය. ධනවාදය යටතේ සාක්ෂාත් කල නො හැකි ජාත්‍යන්තර සම්බන්ධීකරනයක හා දැනුවත් සමාජ සැලසුම්කරනයක මට්ටමක්, කර්මාන්තයේ හා තාක්ෂනයේ යෝධ සංවර්ධනය තුලින් නැඟී ආ භුගෝලීය හා මහජන සමාජයේ සංකීර්නත්වය විසින් ඉල්ලා සිටියි. ග්‍රහලෝකය එකිනෙක සමග තරගකාරී වන ජාතික රාජ්‍යයන්ට බෙදී තිබිය දී පදනමෙන් ම ලෝක ස්වභාවයක් ගන්නා ගැටලු විසඳිය හැක්කේ කෙසේ ද? තීරනාත්මක මූල්‍ය සම්පත් යෙදවීමේ දී එය ව්‍යාපාරික ලාභ හා පෞද්ගලික ධනයේ ගනන් බැලීම් මත තීරනය කරන්නා වූ සමාජ ආර්ථික රාමුවක් තුල, පෝෂන ගුනය, අධ්‍යාපනය, නිවාස, සෞඛ්‍ය පහසුකම් හා අප්‍රමාන වූ තවත් සමාජ අවශ්‍යතාවන් හා උවමනාවන්ගෙන් පෙලෙන බිලියන ගනනක් මිනිසුන් තෘප්තිමත් කල හැක්කේ කෙසේ ද? මෙම ගැටලු ධනවාදී පදනමක් මත විසඳිය නො හැකි ය. මූල්‍ය කතිපයාධිකාරයේ පාලනයට නතු වූ අන්තර්ජාතික සමාගම්වල ඒකාධිපතිත්වය අවසන් විය යුතු ය. නව, සාමුහික හා අව්‍යාජව ප්‍රජාතන්ත්‍රීය වූ මාධ්‍යයන් සමාජ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා සම්පත් යෙදවීමේ දී අවශ්‍ය ය.

34. මෙම ක්‍රියාමාර්ගය සඳහා සටනේ දී ජාත්‍යන්තර හා සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත පදනම් වූ කම්කරු පන්තියේ නව දේශපාලන පක්ෂයක් ගොඩනැගීම පූර්වාපේක්ෂා කරනු ලැබේ. 2004 මැතිවරනයට අපගේ මැදිහත්වීම තුල ප්‍රකාශනය අත් කර ගත් සමාජවාදී සමානතා පක්ෂය විසින් භාරගෙන තිබෙන කර්තව්‍ය වන්නේ මෙය යි. සංවිධානාත්මක ආස්ථානයකින් ගත් කල ජනාධිපතිවරන ව්‍යාපාරයේ අපගේ කායික පරිමානය අපගේ පක්ෂය සතු සීමිත සම්පත්වලට සීමා විය. ඇමරිකා එක්සත් ජනපදය වැනි විශාල රටක රිපබ්ලිකන් හා ඩිමොක්‍රැටික් දෙබෑයන් වෙනුවෙන් මැතිවරන නිලධාරීන් විසින් තෙවැනි පක්ෂ අපේක්ෂකයන්ගේ මාර්ගය හරස් කිරීමට තැබූ බාධකයන් ඉමහත් ය. ඉලිනොයිස් හා ඔහායෝහි දී අපගේ අපේක්ෂකයන් ඡන්ද පත්‍රිකාවෙන් ඉවත් කර තැබීමට රාජ්‍ය නිලධාරීන් විසින් දැරූ උත්සාහයට එරෙහිව අපට කටුක හා මිල අධික සටනක් ගෙනයාමට සිදු විය. ඉලිනොයිස්හි දී ටොම් මැකමන් ඡන්ද පත්‍රිකාවෙන් ඉවත් කිරීමට ගත් උත්සාහය අපි පරාජය කලෙමු. එසේ වුවත් ඔහායොහි දී මැතිවරන දිනය ලඟා වී ආපසුත් ගිය නමුත් අපගේ අභියාචනය තවමත් ෆෙඩරල් උසාවිය තුල තීන්දුව අපේක්ෂාවෙන් සිටියි. සියලුම සීමා සහිතකම් හා දුෂ්කරතා තිබිය දීත් අපගේ අපේක්ෂකයන් අනර්ග ලෙස කටයුතු කරමින් විශේෂයෙන් ම මේන් හා ඉලිනොයිස්හි මෙන් සමහර අවස්ථාවල සැලකිය යුතු ඡන්ද සංඛ්‍යාවක් රැස්කර ගත්හ. එහෙත් වඩා වැදගත් වන්නේ ක්ෂනික ප්‍රායෝගික ප්‍රතිඵලවලට වඩා දිගුකල් පවත්නා සමාජවාදී සමානතා පක්ෂයේ මැදිහත්වීමෙහි දේශපාලනික ප්‍රතිවිපාකයන් ය.

35. සමාජවාදීන්ට නම් ඔවුන්ගේ දේශපාලනික ක්‍රියාකාරකම් මැන බැලීමට හා තක්සේරු කිරීමට ඇත්තේ එක් තීරනාත්මක මිනුම් දන්ඩක් ය. ඔවුන්ගේ දේශපාලන කටයුතු මගින් ඔවුන් කොතෙක් දුරට කම්කරු පන්තියේ වෛෂයික අවශ්‍යතාවන් ප්‍රකාශයට පත් කලේ ද එහි දේශපාලන අධ්‍යාපනයට කෙතෙක් දායක වී ද හා අනාගත අරගලයන් සඳහා කොතෙක් භූමිය සකස් කලේ ද යන්න යි. මෙම ආස්ථානයෙහි සිට 2004 දී සමාජවාදී සමානතා පක්ෂය දිනාගත් දේ පිලිබඳ ව ආඩම්බර වීමට සියලු හේතු කාරනා අප සතු ය. ඇමරිකානු හා ලෝක ධනවාදයේ අර්බුදය පිලිබඳව පැහැදිලි විශ්ලේෂනයක් කර ජාත්‍යන්තර සමාජවාදී මූලෝපායක් ඉදිරිපත් කල වේදිකාවක් මත පදනම් වූ අපගේ මැතිවරන ව්‍යාපාරය, අනාගත අරගල සඳහා මාර්ගෝපදේශයක් ලෙස මැතිවරන ව්‍යාපාරයෙන් එපිටට ද පවතිනු ඇත.

36. සසප විසින් ඉදිරිපත් කල ඉදිරිදර්ශනය අප්‍රමාන රැඩිකල් ප්‍රවනතාවන්ට සපුරා වෙනස් වූ අතර ඔවුන් අඩු හෝ වැඩි තරමින් ද්වි පක්ෂ ක්‍රමය පිලිබඳ ඒ හෝ මේ විවේචනය නොතකා 2004 ඔවුන්ගේ දේශපාලන මැදිහත්වීමේ පිලිසිඳගෙන තිබුනේ ඩිමොක්‍රැටික් පක්ෂය වමට තල්ලු කිරීම සඳහා බලපෑම් කිරීමේ මාර්ගයක් සේ ය. සත්තකින් ම හරිත පක්ෂයේ නාඩර් හා අනෙකුත් නිල අපේක්ෂකයන්ගේ අරමුන වූයේ මෙය යි. මෙම ඉදිරිදර්ශනයේ වඩාත් බංකොලොත් හා මංමුලා සහගත ප්‍රකාශනය දැකගත හැක්කේ *නේෂන්හි* දේශපාලන පිලිවෙත තුල වන අතර මැතිවරනය ආසන්නයේ දී ජෝන් කෙරීට රුව්දෙන්නා වූ අනුමැතිය පලකිරීමක් ඉන් නිකුත් විය. ඔවුන් ඔහු වර්නනා කලේ “දැඩි අධිෂ්ඨානයකින් ද, ගැඹුරු දැනුමකින් ද, ඉහල බුද්ධිමත් භාවයකින් ද යුත් මිනිසා” ලෙස ය. ඔහුගේ පෞද්ගලික ගුනාංගයන්ට අමතරව එක්සත් ජනපදය

තුල ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගත හැකි එකම මාවත කෙරීගේ ජයග්‍රහනය බව ඔවුහු තර්ක කලහ. බුෂ් යලි තේරී පත්වීම එක්සත් ජනපදයේ ව්‍යවස්ථාමය පාලනයට තර්ජනයක් වනු ඇත. මෙම අන්තරාය මගහැරිය හැක්කේ කෙරී තෝරා ගැනීමෙන් පමනකි.

37. *නේෂන්හි* ආස්ථානය ගැන දීර්ඝ විවේචනයක් කිරීමට කාලය මට ඉඩ දෙන්නේ නැත. මම විසිවන සියවසේ බේදවාචකයන් වෙතින් මතු වී තිබෙන වඩාත්ම වැදගත් පාඩම් *නේෂන්හි* පිලිවෙතින් ප්‍රතික්ෂේප කර ඇත්තේ කෙසේ දැයි පෙන්වා දීමට සීමාවන්නෙමි. 1930 ගනන්වල යුරෝපා ෆැසිස්ට්වාදයේ අත්දැකීම් පෙන්වා දී ඇති පරිදි සිය ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කර ගැනීමේ කම්කරු පන්ති වෑයම් සඳහා කම්කරු පන්තිය ස්වාධීනව බලමුලු ගැන්වීම අවශ්‍ය වන බව ය. එය දේශපාලනිකව පාලක ප්‍රභුවේ පක්ෂවලට යටත්ව සිටිනතාක් දුරට එයට ආඥාදායකත්ව තර්ජනයට එරෙහිව සටන් වැදිය නො හැක. කම්කරුවන්ට ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කර ගැනීමේ දී ඩිමොක්‍රටික් පක්ෂය කෙරෙහි විශ්වාසය තබන ලෙසට උපදෙස් දීම *නේෂන්* "පැකිලෙන අධිරාජ්‍යවාදීන්" යයි එම කතුවැකියෙහි ම විස්තර කරන්නා වූ - සියදිවි නසාගැනීමට අනුශාසනා කිරීමකි.

38. බුෂ් යලි තේරී පත්වීමට *නේෂන්හි* ප්‍රතිචාරය සන්ත්‍රාසය හා අපේක්ෂා භංගය වීම කෙසේ වත් මවිතය දනවන්නක් නො වේ. "වැලපීම" යන හිසින් යුත් ලිපියක කථා පොලිට් සමස්ත ඇමරිකානු ජනතාවටම වාචක අකුනු පහරවල් එල්ල කරයි. ජෝන් කෙරී, "ඉතා හොඳ අපේක්ෂකයෙක් විය" යි ඇය ලියයි, එහෙත් ගැටලුව වන්නේ "ඡන්දදායකයන් තමන්ට සැබවින්ම අවශ්‍ය ජාතිකවාදය, පූර්වභංග යුද්ධය, යුක්තිය නොව පිලිවෙල, වධදීම මගින් ආරක්ෂාව, කාන්තාවන්ට හා සමලිංගිකයන්ට එරෙහිව ප්‍රහාර, ඇත්තන් හා නැත්තන් අතර ආගාධය, ඔවුන්ගේ පල්ලිවලට ආන්ඩුවේ සන්තෝෂම් හා හිතුවක්කාරී හෝ මංපහරන ජනාධිපති" තෝරා ගනියි.

39. පොලිට් ජෝන් කෙරීගේ උත්සාහයන්ට තරම් නොවන්නන් සේ ඇමරිකානු ජනතාව හෙලා දකින අතරතුර *නේෂන්හි* කතුවරුන් වෙනත් පිටුවක දී අඳෝනා නගන්නේ "ඩිමොක්‍රටික් අපේක්ෂකයා මැතිවරන ව්‍යාපාරයේ කිසිදු අවස්ථාවකදී වත් රට මුහුන පා සිටින වඩාත් වැදගත් එකම කාරනය ගැන අව්‍යාජව සාකච්ඡා නො කලේ ය: එනම් ඉරාක යුද්ධයෙන් ගැලවෙන්නේ කෙසේ ද යන්න ගැන" කම්කරුවන්ගේ සැබෑ සමාජ උත්සුකයන් ගැන හෝ කතාකිරීමට කෙරී අසමත් වූ බව ඔවුහු පිලිගනිති. "ඔහු ඔවුන්ගේ දුක්ගැනවිලිවලට සාධාරන ලෙස පෙනී යන ප්‍රතිකර්මයක් ඉදිරිපත් නො කලේ ය." මෙම දුබලකම් තිබියදීත් ඩිමොක්‍රටික් පක්ෂයට බලපෑම් කිරීම සඳහා ඔවුන්ගේ කැපවීම *නේෂන්හි* කතුවරුන් යලිදු සහතික කරයි. "ඓතිහාසිකව", එම පක්ෂයේ වටිනාම අවස්ථාවන් එලඹ ඇත්තේ එය පනගැන්වීමට මහජන ව්‍යාපාරයන් විසින් පිටතින් තල්ලුව සැපයූ විට ය, එනම් කම්කරු ව්‍යාපාරයේ පටන් සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයටත්, කාන්තාවන්ගේ ව්‍යාපාරයටත් සම ලිංගික අයිතිවාසිකම් ව්‍යාපාරයටත් වසයෙන් ය" යනුවෙන් *නේෂන්* ලියයි.

40. සමාජවාදී සමානතා පක්ෂය මෙම විශ්ලේෂනය හා ඉදිරිදර්ශනය මුලුමනින්ම ප්‍රතික්ෂේප කරයි. ඩිමොක්‍රටික් පක්ෂයෙන් නිසැක ලෙසම හා බැහැර කල නොහැකි ලෙස බිඳී වෙන්වීමෙන් පමනක් කම්කරු පන්තියට ඉදිරියට ගමන් කල හැකි වේ. මෙම බිඳීමෙන් අදහස් කෙරෙන්නේ සංවිධානාත්මක සබඳතාවල වෙනසක් පමනක් නොව දේශපාලන ඉදිරිදර්ශනයේ හා කම්කරු පන්තියේ ලෝක දෘෂ්ටියෙහි ද ප්‍රගාඪ හා අවසානය දක්වාම සිදුවිය යුතු පරිවර්තනයක් ද අවශ්‍ය කෙරෙන බව යි. එයට ජාතිකවාදයේ සිට ජාත්‍යන්තර ඉදිරිදර්ශනයක් කරා වූ මාරුවීමක්; ධනවාදයේ සදාකාලිකකම පිලිගැනීමේ පරාජකවාදයේ සිට සමාජවාදයේ අවශ්‍යතාව තේරුම් ගැනීම කරා; දේවල් කිසියම් දිනක හොඳ අතට හැරේය යන සොච්චම් බලාපොරොත්තුවේ සිට ඇමරිකානු සමාජය විප්ලවකාරීව ව්‍යුහගත කිරීම සඳහා උද්යෝගීමත්ව පෙනීසිටීම ද අන්තර්ගත වෙයි.

41. එවන් පරිවර්තනයකට වාසිදායක වන සාධක දෙකක් ක්‍රියාත්මක වේ. ඉන් පලමු වැන්න කම්කරු පන්තියට කම්පනයන්ගෙන් ද සමාජ පිපිරීම්වලින් ද හිඟ නො වන ධනවාදය තුල ම පවත්නා වෛෂයික අර්බුදය යි. යුද්ධය නිකම්ම ඉවත්ව නො යෑම කෙසේ වෙතත් යාන්තම් අවහිරයක් ලෙස ඇත ක්ෂිතිජයේ ඇ දී නො තිබෙනු ඇත. සෑම විට ම සිදුවන්නාක් මෙන් යුද්ධයේ බිහිසුනු කමෙහි සෙවනැල්ල තවතවත් පුලුල් වන්නා වූ ප්‍රදේශ කරා පැතිරී යමින් වඩාත් විශාල වන මානුෂික කැපකිරීම් ඉල්ලා සිටිනු ඇති අතර රට තුල අයිතීන් බාදනය වීම වේගවත් කෙරෙනු ඇත. කම්කරු පන්තියේ ජීවන මට්ටම් කෙරෙහි එල්ලවෙමින් තිබෙන ප්‍රහාරයන්ගෙන් සහනයක් ලබාගැනීමට ද ධනේශ්වර ක්‍රමයේ භූගෝලීය විසංවාදයන් සමුච්ඡය වීම තුලින් ඉඩ නො ලැබෙනු ඇත. මැතිවරනයෙන් පසුව ඩොලරයේ පහල වැටීම වේගවත්වීම, නරක අතට හැරෙමින් තිබෙන ආර්ථික අස්ථාවරත්වයේ පෙරනිමිත්තකි. උග්‍රවන අර්බුදය විසින් ඇති කරන වින්නැහිය තමන්ගේ වඩාත්ම මූලික සමාජ අවශ්‍යතාවන් ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාවය කම්කරුවන් ඉදිරියට පමුනුවනු ඇත.

42. දෙවැනි සාධකය ආත්මීය ස්වභාවයක් ගනියි; එනම්, සමාජවාදී සමානතා පක්ෂයේ උත්සාහය යි. හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවෙහි සිය සම චින්තකයන් සමග සන්ධානගතව සමාජවාදයේ මූලධර්මයන්ගෙන් වැඩි කරන ජනතාව ද ශිෂ්‍යයන් ද ඇතුලත් නව පරම්පරාවක් උගන්වා ගැනීම හා ඓතිහාසික ස්වභාවයක් ගන්නා අරගලයන්ට කම්කරු

පන්තිය ඇතුල් වන විට ඔවුන්ට සමස්තයක් වසයෙන් පැහැදිලි දේශපාලන දිශානතියක් සම්පාදනය කිරීම යි. මැතිවරනයෙන් පසුව ගත වූ දින ගනනාව තුල *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කියවන පාඨකයන් වෙතින් විශාල සංඛ්‍යාවක් ලිපි අප වෙත ලැබී ඇති අතර ඒ තුල පුලුල් පරිමානයක ආකල්පයන්, ආවේගයන් ප්‍රකාශයට පත් වෙයි. කෝපය, පිලිකුල, ව්‍යාකූලත්වය, දොම්නස හා ශෝකය. සමහර ලිපි මේ සියලුම මූලධාතූන් අඩංගු කර ගනියි. එහෙත් ලිපි වැඩිහරියක පෙරලා සටන් වැදීමට ඇති කැමැත්ත පලවන අතර ඔවුන්ගේ ම දේශපාලන සංකල්පයන් යලි පරීක්ෂා කිරීමේ ඕනෑකම හඳුනාගැනීම හා ඒවා වෙනස් කර ගැනීමේ හැකියාව ද ප්‍රකාශ කෙරේ. මැතිවරන ප්‍රතිඵල විසින් පවතින දේ කලඹා තිබේ.

43. මෙය සසපයට අවස්ථාවක් හා අභියෝගයක් ඉදිරිපත් කරයි. සමාජවාදී සමානතා පක්ෂයේ කටයුතු පුලුල් කිරීමේ දැවැන්ත වගකීම ඒ මත වැටී ඇති අතර *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* අති විශාල දෛනික පාඨකයන් අතර සිටින බොහෝ ආධාරකරුවන් වෙතට වඩාත් ආක්‍රමනශීලීව හා නොකඩවා ලඟා වීම ද මෙම පාඨකයන් හා ආධාරකරුවන් ගෙන් බොහෝ දෙනෙක් සමාජවාදී සමානතා පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයන් බවට පත් කර ගැනීමට ද අවශ්‍ය ය.

44. එක්සත් ජනපදය තුල සමාජවාදය සඳහා අරගලයේ දී මතුවනු ඇති දුෂ්කරතාවන් අවම කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම අප නො කරන්නෙමු. දශක ගනනාවක ප්‍රති කොමියුනිස්ට්වාදී ප්‍රචාරය හා දඩයම් කිරීම් ද වෘත්තීය සමිතිවල පාවාදීම් හා දූෂනය ද, දේශපාලනිකව ක්‍රියාශීලී බුද්ධිමතුන්ගේ සාපේක්ෂ හිඟය ද, මහජන සංස්කෘතියේ පහල මට්ටම හා ජනසන්නිවේදන මාධ්‍යයේ පිලිකුල් සහගත බලපෑම, ජාතික පටු මානසිකත්වයේ සම්ප්‍රදායන්, "රලු පුද්ගලවාදයේ" අඛන්ඩ පැවැත්ම හා ඉතිහාසය හා න්‍යායික සාමාන්‍යකරනය කෙරෙහි දක්වන තත්කාර්යවාදී පිලිකුල ආදී මේ සියලු සාධක සමාජවාදී පන්ති සවිඥානකත්වය සඳහා අරගලය සංකීර්න කර තිබේ. එහෙත් අප අපගේ ප්‍රවේශය ලෙස සලකන්නේ ඇමරිකානු හා ලෝක ධනවාදයේ අර්බුදයෙහි ඇඟවීම් ය. තව ද ක්‍රියාවලිය කොතෙක් සංකීර්න වුවත් අවසාන විග්‍රහයේ දී සමාජ පැවැත්මේ ක්‍රියාව සමාජ විඥානය තීරනය කරයි. ලියොන් ට්‍රොට්ස්කි වරෙක මනා ලෙස කියා ඇත්තේ දිගු කාලයේ දී ඉතිහාසය විසින් කම්කරු පන්තියේ විඥානය කරා මාවතක් පාදනු ඇති බව යි. ඇමරිකානු කම්කරුවන්ට ධනවාදයේ අර්බුදයෙන් නැගී එන ගැටලු විසඳා ගැනීම සඳහා මාවතක් සෙවීමේ දී සමාජවාදය හා ජාත්‍යන්තරවාදයේ මාවත හැර වෙන අන් මගක් නො ලැබෙනු ඇත. අන් සියලු මාර්ග යොමුවන්නේ විනාශය කරා ය. කම්කරු පන්තිය හමුවේ ඇති විකල්පය එයයි. සමාජවාදී සමානතා පක්ෂයේ හා *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* වගකීම වන්නේ මෙම විකල්පය අපට හැකිතාක් පැහැදිලි හා නිවැරදි ලෙස කම්කරු පන්තිය හමුවේ තැබීම යි. අප මෙය ඉටු කරන තාක් දුරට කම්කරු පන්තිය වඩාත් මනාප කුමන විකල්පයට දැයි තීරනය කිරීම ඊට පැවරිය හැකි ය.

© www.wsws.org